ජනාබත් හෙවත් ස්නානය කිරීම අනිවාර්යය කරන අවස්ථාවක ස්නානය කරන ක්රමය.

මුඃමින්වරුන්ගේ මෑණියක් වූ මයිමූනා බින්තු අල් හාරිස් (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූත නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත (ජනාබත්) ස්නානය සඳහා මම ජලය ගෙනැවිත් එතුමාව වස්ත්රයකින් ආවරණය කළෙමි. එතුමාණෝ තම අත් දෙකට ජලය වක්කර ගෙන ඒ දෙක සෝදා ගත්හ. පසුව එතුමාණන් තම දකුණතින් තම වම් අතට ජලය වක්කර පසුව තම ලිගේන්‌ද්රිය සෝදා ගත්හ. පසුව තම අත පොළවෙ අතුල්ලා එය පිරිමැද එය සෝදා හැරයහ. පසුව කට කළත්වා පිරිසිදු කොට නාසයට ජලය යවා පිරිසිදු කොට තම මුහුණ
හා තම අත් දෙක ද සෝදා ගත්හ. පසුව තම හිස මතට ජලය වක්කර තම ශරීරය පුරා ගලා යාමට සැලැස්වූහ. පසුව එතුමාණන්ගේ පාද දෙක සේදූහ. අනතුරුව මම ඇඳුමක් එතුමාණන්ට
දුන්නෙමි. නමුත් එතුමාණන් එය ගත්තේ නැත. එතුමාණෝ තම අතින්ම ජලය පිස දැමූහ."
[صحيح] [متفق عليه]

මුඃමින්වරුන්ගේ මෑණියක් වූ මයිමූනා බින්තු අල් හාරිස් (රළියල්ලාහු අන්හා) තුමිය විසින් ජනාබත් හෙවත් මහා කිල්ලෙන් අනිවාර්යය වූ ස්නානය නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ස්නානය කළ අයුරු මෙසේ දන්වා සිටියාය. ඇය එතුමාණන් ස්නානය කරනු පිණිස ජලය ගෙනැවිත් එතුමා තිරයකින් ආවරණය කළාය. පසුව පහත සඳහන් අයුරින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ ක්රියා කළහ. පළමුව: එතුමාණෝ තම අත් දෙක භාජනයට දෑමිමට පෙර අත් දෙක මත ජලය වක්කර සෝදා ගත්හ. දෙවැන්න: එතුමාණන් තම දකුණතින් තම වම් අතට ජලය වක්කර පසුව තම ලිගේන්‌ද්රිය සෝදා ගත්හ. එය එහි තැවරී ඇති දෑ වලින් එය පිරිසිදු කර ගනු පිණිසය. තුන්වැන්න: තම අත පොළවට (පස් මත) තබා එය පිරිමැද සෝදා හැරියහ. එය අත්වල තැවරුණු දෑ ඉවත් කරනු පිණිසය. සිව්වැන්න: ජලය මුඛය තුළට යවා එය කළත්වා පසුව එය විසිකර, කට පිරිසිදු කර ගත් අතර නාසයට ද එම ජලය යවා, පිරිසිදු කොට පසුව එය බැහැර කොට පිරිසිදු කර ගත්හ. පස්වැන්න: තම මුහුණ හා තම අත් දෙක ද සෝදා ගත්හ. හයවනුව: තම හිස මතට ජලය වක්කර ගත්හ. හත්වනුව: තම ශරීරයේ ඉතිරි කොටස් මත ද ජලය ගලා යාමට සැලැස්වූහ. අටවනුව: එතුමාණන් තමා සිටි ස්ථානයෙන් වෙනත් තැනකට ගොස් තම පාද දෙක සේදූහ. ඒ දෙක කළින් සෝදා නොතිබුණු හේතුවෙන්ය. පසුව පිසදමනු පිණිස ඇය එතුමාණන් වෙත රෙදි කඩක් ගෙනවිත් දුන් නමුත් එතුමාණන් එය ගත්තේ නැත. එතුමාණෝ තම අතින්ම ශරීරයේ තැවරී ඇති ජලය පිස දැමූහ.

http://www.sunnah.global/hadeeth/si/show/3310